# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1655/2 - 2010 මැයි 24 වැනි සඳුදා - 2010.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2010 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2010 අංක 01 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2010 අප්‍රේල් මස 21 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 2008 අගෝස්තු මස 18 වැනි දින අංක 1563/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත සහ කලින් කල සංශෝධිත 1990 ජනවාරි මස 5 වැනි දින අංක 591/18 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1990 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නාමාවලියේ, 16 වන ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (3) වන උප ඡේදයෙහි (iv) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :–

" (iv) ගණිතය සහ පරිගණක විද්‍යාව" සහ

(ආ) එහි (4) වන උප ඡේදයෙහි (vi) වන අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :–

" (vi) පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණය"

05 - 147


1A - G 12876 — 835 (2010/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.